දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය } NA/09/PBS (2023) /01/2024
எனது இல }
My No. }

ඔබේ අංකය }
உமது இல }
Your No. }

දිනය }2024.07. 19
திகதி }
Date }

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

අදාළ සියලු දෙනාගේ දැනගැනීම සඳහා,

**වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය (මාස 12) වින්නඹු කර්මය/මානසික හෙදකම (මාස 06) අඩංගු වසර 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලව සඳහා බඳවා ගැනීම - 2023.**

උක්ත පාඨමාලාවට අදාළව අංක 02-23/2023 හා 2023.02.02 දිනැතිව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ ලිපිය අනුව රේඛීය අමාත්‍යාංශය මගින් පාලනය වන රෝහල් හා ඊට අනුරූපීව ආයුර්වේද දෙපාර්තමේන්තුව, අර්ධ රාජ්‍ය හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩල මගින් පාලනය වන රෝහල්/ආයතන හා පළාත් සභා යටතේ අයදුම්පත් යොමුකර ඇති හෙද නිලධාරීන්ගේ අවධානය පිණිසයි.

02. ඒ අනුව, ඉහත පාඨමාලාවට අදාළව සීමිත ධාරාවේ ලිඛිත තරඟ විභාගය සඳහා අයදුම්පත් යොමුකර ඇති නිලධාරීන් අතුරින් විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම් අංක 01,02, හා 03 මගින් දක්වා ඇත.

03. එම ලේඛනයේ නම් සඳහන් නිලධාරී/නිලධාරිනියන් සඳහා වූ අදාළ විභාගය 2024.07. 27 දින දිවයින පුරා තෝරාගත් විභාග මධ්‍යස්ථාන ගණනාවක දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ අනුව, ඇමුණුම් අංක 01,02 හා 03 හි පමණක් නම් සඳහන් නිලධාරී/නිලධාරියන් සියලුම දෙනා සඳහා, දක්වා ඇති ලිපිනයන් වෙත සෞඛ්‍ය අමාත්‍යාංශයේ විභාග ශාඛාව මගින් විභාග ප්‍රවේශ පත් නිකුත් කර ඇත.

04. එසේ නිකුත් කර ඇති විභාග ප්‍රවේශ පත් කිසියම් අපේක්ෂකයකු වෙත 2024.07.23 දින සවස් භාගය වන විටත් නොලැබී ඇතිනම් පමණක්, ඒ සම්බන්ධව දැනුම්දීමට හා අවශ්‍ය කටයුතු සිදුකර ගැනීම සඳහා **2024.07.24** හා **2024.07.25** යන දෙදින තුළ **පෙ.ව 9.00** සිට **ප.ව 4.00** දක්වා කාලයේ දී අමාත්‍යාංශ විභාග ශාඛාව වෙත පැමිණෙන ලෙස දැනුම් දෙමි.

වාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට.

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

**සැ.යු - විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයින් සියලුම දෙනා අදාළ විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර පැමිණීම අනිවාර්යය වන අතර, එසේ සිදුකිරීමට අපොහොසත් වුවහොත් විභාගය සඳහා පෙනී සිටීමට කිසිදු අවස්ථාවක් ලබා නොදෙන බව තරයේ සැලකිය යුතු වේ.**

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය }NA/09/PBS (2023) /01/2024
எனது இல }
My No. }

ඔබේ අංකය }
உமது இல }
Your No. }

දිනය }2024.07. 19
திகதி }
Date }

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

For information of all concerned,

**<u>Recruitment to the Post Basic Training for 1 ½ Years Diploma Course Containing the Ward Management and Supervision (12 Months) and Midwifery/ Psychiatric Nursing (06 Months) – 2023.</u>**

This is for the attention of the Nursing officers serving in hospitals under the Line Ministry and the Department of Ayurveda, semi-government hospitals/institutions, hospitals/institutions governed by other statutory boards and hospitals/institutions under the Provincial Councils who have sent applications for the above course in terms of the General Circular No. 02-23/2023 dated 02.02.2023.

02. Accordingly, from the officers who have submitted applications for the above course under the limited stream, the list of names of the officers who are eligible to sit the examination, is given in the Annexures 01, 02, and 03.

03. The examination for the officers whose names are in the above list, is scheduled to be held on 27.07.2024 at a number of selected examination centres Island-wide. Accordingly, the admission cards of all officers whose names are given in the Annexures 01, 02, and 03, have been sent to reach the addresses mentioned in the applications by the Examination Branch of the Ministry of Health.

04. In case any candidate has not received the admission card by afternoon of 23.07.2024, please visit the Examination Branch of the Ministry on **24.07.2024** and **25.07.2024** from **9.00 am to 4.00 pm** to inform the same and to get necessary arrangements made.

Chamika H. Gamage
Deputy Director General (Admin) II
For Secretary.

Chamika H. Gamage
Deputy Director General (Administration) II
Ministry of Health
"Suwasiripaya"
Colombo 10.

**NB – It is compulsory for all candidates who sit the examination to get their signature on the admission card attested and the candidates who fail to do so will not be permitted to sit the examination for any reason.**